

# බෙදීම - 2

දෙකෙන් බෙදමු.




■ දොඩම් ගෙඩි 6ක් වට්ටි දෙකකට සම සමව බෙදූ විට එක් වට්ටියක කීයක් තිබේ ද?

හය බෙදීම දෙක සමානයි තුන

$$6 \div 2 = 3$$

■ දොඩම් ගෙඩි 6ක් දෙක බැගින් වට්ටි කීයකට දැමිය හැකි ද?

හය බෙදීම දෙක සමානයි තුන

$$6 \div 2 = 3$$

දෙකෙන් බෙදමු. පිළිතුරු ලියමු.


උදාහරණය :- $6 \div 2$ = ..3..

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) | $2 \div 2$ | = | ................. | (5) | $12 \div 2$ | = | ................. |
| (2) | $4 \div 2$ | = | ................. | (6) | $14 \div 2$ | = | ................. |
| (3) | $8 \div 2$ | = | ................. | (7) | $16 \div 2$ | = | ................. |
| (4) | $10 \div 2$ | = | ................. | (8) | $18 \div 2$ | = | ................. |


# බෙදීම - 2

## 24 දෙකෙන් බෙදමු.




එය සමානව ගොඩවල් දෙකකට බෙදමු.




එක ගොඩක දහයේ ඒවා 1ක් සහ එකේ ඒවා 2ක් ඇත.

එනම් 12කි.

## දීර්ඝ බෙදීමේ ක්‍රමයට පිළිතුර ලබා ගනිමු.

$$
\begin{array}{r|l}
 & 1\ 2 \\ \hline
2 & 2\ 4 \\
 & \underline{2}\ \downarrow \\
 & 0\ 4 \\
 & \ \ \underline{4} \\
 & \ \ 0
\end{array}
$$

$24 \div 2 = \underline{\underline{12}}$



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

# 22 බෙදීම - 2

**අභ්‍යාස පොතේ ලියා දීර්ඝ බෙදීමේ ක්‍රමයට විසඳමු.**

(1) $2\overline{)22}$

(2) $2\overline{)20}$

(3) $2\overline{)26}$

(4) $2\overline{)28}$

(5) $2\overline{)44}$

(6) $2\overline{)42}$

(7) $2\overline{)66}$

(8) $2\overline{)68}$

(9) $2\overline{)84}$

(10) $2\overline{)88}$

(11) නංගී ළඟ වළලු 8ක් ඇත. එක් අයකුට වළලු දෙක බැගින් කී දෙනකුට බෙදා දිය හැකි ද?

(12) පෙට්ටියක පැන්සල් 26ක් තිබිණි. එක් අයකුට පැන්සල් දෙක බැගින් කී දෙනකුට බෙදිය හැකි ද?

(13) පෙට්ටියක ගස්ලබු ගෙඩි 40ක් තිබුණි. ඒවා සමානව දෙදෙනකු අතර බෙදූ විට එක් අයකුට කීයක් ලැබිණි ද?

(14) පොල් ගෙඩි 64ක් සමානව ගොඩවල් දෙකකට බෙදූ විට එක් ගොඩක පොල් ගෙඩි කීයක් තිබේ ද?

(15) ඇපල් ගෙඩි 86ක් පෙට්ටි දෙකකට සමානව දමන ලදි. එක් පෙට්ටියක ඇති ඇපල් ගෙඩි ගණන කීය ද?



නොමිලේ බෙදා හැරීම සඳහා ය.